# විශ්වවිද්‍යාල තුළ කලා විෂය ධාරාවේ විද්‍යාර්ථීන්ට ආයතනික පුහුණුව සඳහා වෙන්කරන කාල සීමාවේ ප්‍රමාණවත්භාවය

**එම්. ඩී. එම්. උබේසේන**[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි උසස් අධ්‍යාපනය ලබන සිසුන් තම උපාධිය සම්පූර්ණ කිරීමට ආයතනික පුහුණුවක් ලැබිය යුතුය. විවිධ විෂය ධාරා අනුව, විශ්වවිද්‍යාලවලින් ආයතනික පුහුණුව සඳහා වෙන්කරන කාල සීමාව වෙනස් වේ. මෙම කාලය තුල ප්‍රමාණවත් පුහුණුවක් සිසුන් හට ලබා ගතහැකි දැයි ගැටලුවකි. එම නිසා විශ්වවිද්‍යාලවල කලා විෂය ධාරාවේ සිසුන්හට ආයතනික පුහුණුව සඳහා වෙන් කරන කාල සීමාව කොතෙක් දුරට ප්‍රමාණවත්දැයි සෙවීම උදෙසා කැලණිය විශ්වවිද්‍යාලය ආශ්‍රයෙන් පර්යේෂණයක් සිදු කරන ලදී. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ සියලු අධ්‍යයන අංශවලින් තෙවන, සිව්වන වසර විද්‍යාර්ථයින්ගෙන් ස්තෘත සසම්භාවී නියැඳුම් ක්‍රමය යොදාගෙන 50 දෙනකුගෙන් යුත් නියැදියක් තෝරා ගෙන ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් ප්‍රාථමික දත්ත රැස් කරගන්නා ලදී. විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම හා කයි වර්ග පරික්ෂාව යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණයට අනුව සිසුන්ගෙන් 74% හා 26% ප්‍රකාශ කර සිටියේ, තමන්ට පුහුණුව සඳහා දවස් 30ක හා දවස් 15ක කාලයක් ලැබෙන බවය. එමෙන්ම 100% සිසුන්ගේ මතය ලෙස ලබා දෙන කාල සීමාව තුල ක්‍රමවත් ප්‍රායෝගික පුහුණුවක් ලැබිය නොහැකි බව අනාවරණය විය. ඊට අමතරව පුහුණුව සඳහා තම විෂයට අනුව ආයතනයක් සොයා ගැනීමට අපහසු වීම, සීමිත කාල සීමාව නිසා ආයතන විසින් සිසුන්ට පුහුණුව ලබා දීමට අකැමැති වීම හා පුහුණුව සඳහා සතියට දින 02ක් හෝ 01ක් වෙන් නර තිබීම ආදිය පර්යේෂණය ප්‍රතිඵල විය. මේ අනුව, කලා විෂය ධාරාවේ සිසුන්හට ආයතනික පුහුණුව සඳහා වෙන් කරන කාල සීමාව ප්‍රමාණවත් නොවන බවත්, එමඟින් ගැටලු ඇති වන බව නිගමනය කළ හැකි විය. මේ නිසා ආයතනික පුහුණුව සඳහා වෙන් කරන කාල සීමාව දීර්ඝ කර සතියේ දින පහේම ආයතනික පුහුණුව ලැබීමට අවස්ථාව සලසා දීමට කටයුතු කළහොත්, විශ්වවිද්‍යාලවලින් පිටවෙන උපාධිධාරීන් රටේ සංවර්ධනයට ඵලදායී ලෙස යොදා ගත හැකි බව දැක්විය හැකිය.

**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාල සිසුන්, කලා විෂය ධාරාව, ආයතනික පුහුණුව, කාල සීමාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, madusanka57ubesena@gmail.com